**01-12-2018 උදෑසන මුරලි ඕම් ශාන්ති බාප්දාදා මධුබන්**

**සාරය:** සුමිහිරි දරුවනි, ඔබ සත්ගුරුගේ දරුවන් වන්නා වූ සෑම කෙනෙකුටම ජීවන මුක්තියේ මන්ත්‍රය ලබා දෙන්නා වූ ගුරුන් වේ. ඔබට කිසිම විටෙක දෙවියන් ගැන බොරු කිව නොහැක.

**ප්‍රශ්නය:** එක් ක්ෂණයකින් ජීවන මුක්තිය ලබා ගන්නා වූ ක්‍රමය කුමක්ද, එහි සිහිවටනය කුමක්ද?

**පිළිතුර:** එක් ක්ෂණයකින් ජීවන මුක්තිය ලබා ගැනීම උදෙසා, ඔබේ නිවසේ අයත් සමඟ එකට ජීවත්වන අතරම නෙළුම් මලක් සේ පිවිතුරු ලෙස ජීවත් වන්න. මේ අවසාන උපතේදී පාරිශුද්ධත්වය රැකීමට පොරොන්දු වන්න. එවිට ඔබ ජීවන මුක්තිය ලබනු ඇත. ජනක් රජතුමාගේ සිහිවටනය තිබෙන්නේ මෙම කරුණ හේතුවෙනි. තම පවුලේ අයත් සමඟ එකට ජීවත් වන අතරම, පොරොන්දුව දීමේ පදනම මත ඔහු එක් ක්ෂණයකින් ජීවන මුක්තිය හිමිකර ගනු ලැබුවා.

**ගීතය:** කාලය ගෙවී යයි...

ඕම් ශාන්ති. පියා සෑම කෙනෙකුටම එක් ක්ෂණයකින් ජීවන මුක්තිය ලබාදීම උදෙසා මෙහි පැමිණෙනවා. විමුක්තිය දානය කරන්නාත්, ජීවන මුක්තිය ලබා දෙන්නාත් එකම කෙනෙක්ය යන ප්‍රශංසනීයත්වය තිබෙනවා. ජනක් රජතුමාගේ උදාහරණයෙහි මෙන්, මිනිසුන් මේ ක්ෂණයකින් ලැබෙනා ජීවන මුක්තිය ගැන කතා කරන්නේ ඇයි? ඔහුගේ නම ජනක්, නමුත් පසුව, එම තැනැත්තාම අනු ජනක් (අනාගතයේදි නැවතත් ජනක් බවට පත්වන කෙනා) බවට පත් වුවා. ජනක්, එක් ක්ෂණයකින් ජීවන මුක්තිය හිමිකර ගත්තා යැයි කියැවෙනවා. කොහොමනමුත්, ජීවන මුක්තිය තිබෙනවා යැයි කියන්නේ ස්වර්ණමය හා රිදී යුගයන්හී වේ. ගුරුන් ඔබට මන්ත්‍ර කියා දෙනවා එය ඔබගේ මනස හික්මවන මන්ත්‍රයක් බවත් කියැවෙනවා. ඒ සෑම කෙනෙක්ම මන්ත්‍ර දෙනවා. නමුත් ඔබ ශ්‍රේෂ්ට වූ මන්ත්‍රයක් හිමිකර ගන්නවා. ඒ ජීවන මුක්තියයි. ඔබට මෙම මන්ත්‍රය දෙන්නේ කවුරුන්ද? බ්‍රහ්ම කුමරුන් හා කුමරියන්. ඔවුන්ට මෙම මන්ත්‍රය හමු වුයේ කොහෙන්ද? ඒ සත්ගුරුගෙනි. ශ්‍රේෂ්ටතම වු තැනැත්තා වන්නේ ඒ එකම එක පියායි. පසුව ශ්‍රේෂ්ට වන්නේ දරුවන් වන ඔබයි. ශ්‍රේෂ්ට යැයි කියනා ගුරුන් ඉන්නවා. ඔබත් ගුරුන්. සත් ගුරුගේ ගුරුන්. ගීතාව කියනා අය පවා ගුරුන් ලෙස හැඳින්වෙනවා. ඒ අනුපිළිවෙලක් ඇතිවයි. ඔබත් සත්‍ය කතා කරනා ගුරුන්ය. ඔබ කිසිම විටෙක දෙවියන් ගැන බොරු කියන්නේ නැහැ. පළමුවෙන්ම ඔවුන්ට පාරිශුද්ධත්වය ගැන කියන්න තමා කිසිම විටෙක පාපයෙහි නොගැලෙන බවට පියාට පොරොන්දු වන්න. බොරු නොකීම සාමාන්‍ය දෙයක්. බොහෝ මිනිස්සු බොරු කියනවා. නමුත් මෙහි එසේ නොවේ. මෙහි තිබෙන්නේ පාරිශුද්ධත්වය පිළබඳ ප්‍රශ්නයක්. නිවසේ පවුල් ජීවිතයක් ගත කරනා අතරම, මේ අවසන් උපතේ දී පාරිශුද්ධත්වය රකිනා බවට ඔබ පියාට පොරොන්දු වෙනවා. එමනිසා, මෙතැන තිබෙන්නේ පාරිශුද්ධත්වය රැකීම පිළිබඳ ප්‍රශ්නයක්. මෙය කළ නොහැකි දෙයක්, ළඟා විය නොහැකි තැනක් යැයි කියා මිනිස්සු කියනවා. ඔබ කියනවා වාහ්! එය විය නොහැක්කේ කෙසේද? මෙසේ සිහිපත් කෙරෙනවා නෙළුම් මලක් සේ ජීවත් වෙන්න. ආගමික ග්‍රන්ථ වල මෙම උදාහරණයත් ලියැවී තිබෙනවා. අනිවාර්යෙන්ම පියා ඔබට එවන් වු ඉගැන්වීම් කර තිබෙනවා. දෙවියන්ගේ කීම් මෙන්ම බ්‍රහමින්වරුන්ගේ කීම් ද තිබෙනවා. දෙවියන් සෑම කෙනෙක්ටම කතා කරන්නේ නැහැ. ඔහුට සවන් දෙන්නේ බ්‍රහමින් දරුවන් පමණයි. ඔබ සෑම කෙනෙක්ටම මෙය විස්තරකර දිය යුතුයි. ප්‍රධානම දෙය පාරිශුද්ධත්වයයි. ඔබ ජනක් රජතුමා මෙන් පාරිශුද්ධත්වයට පත්විය යුතුයි. ඒ ජනක්ම පසුව, අනු ජනක් බවට පත්වුවා. හරියට රාධේ පසුව අනුරාධේ (ඇය අනාගතයේදී රාධේ බවට පත් වෙයි) බවට පත් වූවා සේයි. නාරායන් ලෙස හඳුන්වන කෙනෙක් අනාගතයේ අනුනාරායන් බවට පත්වනු ඇත. මෙය නිවැරදියි. මෙහි එන ඕනෑම කෙනෙක්ට ඔබ මෙය විස්තර කර දිය යුතු වෙනවා එක් ක්ෂණයකින් ජීවන මුක්තිය ලැබීම ගැන ඔබ අසා තිබෙනවා. තම පවුලේ අය හා එකට ජීවත්ව සිටිනා අතරම උසස් තත්ත්වයක් ලැබිය හැකියි. අපි කතා කරන්නේ අත්දැකීම් සහිතවයි. බොරු නොවේ. දෙවියන් කතා කරයි දෙවියන් සෑම කෙනෙකුගේම පියාය යන ප්‍රධානම කරුණ විස්තර කර දෙන්න. ඔහු අනිවාර්යෙන්ම ජීවන මුක්තිය දානය කරන්නා ද වනවා. මෙය පවුල් ජීවිත මාර්ගයයි. සන්‍යාසීන් අයත් වන්නේ සියල්ල අත්හැර ගිය මාර්ගයටයි. ඔවුන්ට කිසිම විටෙක රාජයෝගා ඉගැන්විය නොහැකියි. ඔවුන් තම නිවෙස් හා පවුල් අත්හැර දමා පලා යනවා. ඔවුන්ට මෙම දැනුම

දෙන්නට බැහැ. මෙය රාජයෝගයයි. පවුලේ අය හා එකට ජීවත් වන අතරම ඔබ නෙළුම් මලක් සේ පිවිතුරු විය යුතුයි. ස්වර්ණමය යුගයේදී භාරතය පිවිතුරු පවුල් ජීවිතයකින් යුතු පාපයෙන් තොර ලොවක් වුවා. රාජධානියට ස්ත්‍රී, පුරුෂ දෙවර්ගයම අවශ්‍යයි. ඉතින් ඔබ අත්දැකීම් ලත් අය බව මිනිසුන්ට විස්තර කර දෙන්න නිවසේ ජීවත්වන අතරම, අපට නෙළුම් මලක් සේ පිවිතුරුව ජීවත් විය හැකියි. අප පාරිශුද්ධත්වයට පත්ව පියා මාර්ගයෙන් ඒ පිවිතුරු ලෝකයේ පාලකයන් බවට පත්වන බව අප දන්නවා. මෙහි තිබුණේ පිවිතුරු පවුල් ජීවිතයක්, දැන් තිබෙන්නේ අපිරිසිදු පවුල් ජීවිතයක්. මේ ලෝකය දූෂිත වුවක් වන අතර, එය (සත් යුගය) ශ්‍රේෂ්ට ලොවක් වුවා. රාවණ් ඔබව දූෂණය කරවනා අතර රාමා ඔබව ශ්‍රේෂ්ටත්වයට පත්කරවනවා. රාවණ්ගේ රාජ්‍යය කල්ප බාගයක් පුරා පැවතෙනවා. භක්ති මාර්ගය තිබෙන්නේ දූෂිත වූ ලෝකයේයි. දූෂිතත්වය නිසාම මිනිස්සු නොකඩවාම දන් පින් කරනවා. එසේ දන් පින්හී යෙදීමෙන් දෙවියන් හමු විය හැකියැයි ඔවුන් විශ්වාස කරනවා. ඔවුන් දෙවියන්ට වඳිනවා. ඔවුන් මෙසේ කියනවා පැමිණ අපව ශ්‍රේෂ්ටත්වයට පත් කරන්න. භාරතය ශ්‍රේෂ්ට ස්ථානයක් වුවා. නමුත් දැන් එය එසේ නැහැ. දූෂිත වු අය පසුව ශ්‍රේෂ්ටත්වයට පත්වනවා. භාරතයේ නව නිර්මාණය පිළිබඳ වු කතාව කිසිවෙක් දන්නේ නැහැ. පින්තූර යොදාගෙන මෙය ඉතාමත් හොඳින් විස්තර කළ හැකියි. ඔබ එවන් වූ පින්තූර සෑදිය යුතුයි. සෑම මධ්‍යස්ථානයකම ප්‍රදර්ශන පින්තූර කට්ටලයක් තිබිය යුතුයි. බාබා ඔබට උපදෙස් ලබා දෙනවා. ඉතින් තමා ළඟ මෙම පින්තූර නොමැති බව පවසමින් බාබාට ලියතහොත් බාබා ඊට උපදෙස් ලබා දෙනු ඇත ඒවා නිර්මාණය කොට සෑම කෙනෙකුටම යවන්න. එවිට ඒ සෑම කෙනෙක්ම ළඟ එම පින්තූර කට්ටලය තිබෙනවා. මේ පින්තූරවල සම්පූර්ණ අර්ථය ගැබ් වී තිබෙනවා. පළමුවෙන්ම තමා පියාගේ දරුවෙක්ය යන වග ඔබගේ බුද්ධියට ඇතුළු විය යුතුයි. දිව්‍යලෝකය නිර්මාණය කරන්නා වන්නේ දෙවියන්ය. අපායේ නිර්මාණකරුවා වන්නේ රාවණ්ය. චක්‍රයෙහි පින්තූරයෙහි හිස් දහයකින් යුතු රාවණ්ගේ පින්තූරයත් දිව්‍යලෝක ගෝලය මත අත් හතරකින් යුතු ප්‍රතිරූපයත් පෙන්නුම් කරන්න. ඔබට මෙසේ ලියන්නත් පුළුවන් මෙය රාමාගේ රාජ්‍යයයි. මෙය රාවණ්ගේ රාජ්‍යයයි. මේ කාලයේ, රාවණ් සෑම තැනකම ඉන්නවා. එහිදී රාමා සෑම තැනකම සිටී යැයි කියන්නට අපට පිළිවන්කමක් නැහැ. මෙවන් දෙයක් සිහිපත් වනවා ජීව සැහෙන කාලයක් පුරා උත්තරීතර ජීවයෙන් වෙන්ව සිටියා. පසුව, අතරමැදියෙකුගේ ස්වරූපයෙන් ඔබ සත්ගුරු සොයා ගත් කළ ඒ සුන්දර වු හමුවීම සිදුවුවා. එමනිසා, ඔහු අනිවාර්යයෙන්ම පැමිණෙනු ඇත. මෙම ගිණුම ගැන කිසිවෙක් දන්නේ නැහැ. පළමුවෙන්ම වෙන් වන්නේ දේවතාවන්ගේ ජීවයි. ඔබ සෑම කෙනෙක්ටම විස්තර කළ යුතු වන දැනුම මෙයයි. ජීවයන්ගේ පියා ඉන්නවා. ඔහෝ ජීවය, ඔබේ පියා, උත්තරීතර පියා, උත්තරීතර ජීවයේ කාර්යභාරය කුමක්දැයි මට කියන්න. ඔබ එය දන්නේ නැතිද? තම පියා කරනා දෙය නොදන්නා දරුවෙක් සිටිය නොහැකියි. පියා මෙහිදී විස්තර කර දෙනවා ඔබ, ඔබගේම උපත් ගැන දන්නේත් නැහැ. මා ඔබට ඒවා විස්තර කර දෙනවා. පළමු දේවතාවන් මේ තරම් උපත් සංඛ්‍යාවක් ලබා ගන්නවා. ඉතින් අනෙක් ආගම්වල අය කෙතරම් උපත් සංඛ්‍යාවක් ගන්නේ දැයි ගණන් සාදා බලන්න. ඒ සැමකින්ම වැඩිම උපත් සංඛ්‍යාව මෙය බව ඔබ ඔප්පු කොට පෙන්විය යුතුයි. මෙම වෘක්ෂය නොකඩවාම වර්ධනය වනවා. පළමුවෙන්ම දේවතාවන් සිටිනා අතර, උපත් 84ක් ගනු ලබන්නේ ඔවුන් වේ. මෙය භාරතයේ දැනුමයි. පෞරාණික භාරතයේ දැනුම ලබා දුන්නේ කවුරුන්ද? එය දුන්නේ ක්‍රිෂ්ණා බව ඔවුන් විශ්වාස කරන්නේ නැහැ. එය දුන්නේ දෙවියන්, තමා විසින්මයි. පියා, දෙවියන් දැනුමෙන් පිරි තැනැත්තායි. බ්‍රහ්මා හෝ ක්‍රිෂ්ණා යන කිසිවෙක් දැනුමෙන් පිරි තැනැත්තා ලෙස හැඳින්විය නොහැකියි. ක්‍රිෂ්ණාගේ ප්‍රශංසනීයත්වය වෙනයි. මෙය ඉතා පැහැදිලි දැනුමක් වන අතර හොඳින් වටහා ගත යුතු වනවා. සැමගේම දෙවියන් වන්නේ ඒ එකම එක උත්තරීතර පියා, උත්තරීතර ජීවයයි. ඔහු නිර්මාණකරුවා වන අතර, ක්‍රිෂ්ණා වූ කලී නිර්මාණයයි. දෙවියන්, උසස්ම උසස් වු දෙවියන් යනු එක් අයෙකි. ඔහු සෑම තැනකම සිටිනවා යැයි කිව නොහැකියි. භාරතයේ ජනාධිපති උසස්ම කෙනා වන අතර ඉන් පසු අනුපිළිවෙලින් අනෙක් අය ඉන්නවා. සෑම කෙනෙකුටම එකිනෙකාගේ කාර්යභාරයන් පැවරී තිබෙනවා. ඒ සෑම කෙනෙක්ම එක සමාන නැහැ. සෑම ජීවයක්ම අවිනාශී වු කොටසක් ලබා සිටිනා බව ඔබ ඔප්පු කර පෙන්විය යුතු වෙනවා. ඔබ එකිනෙකා අතර මෙය සාකච්ඡා කර සේවය සඳහා සැලසුම් කරන්න. කොහොමනමුත්, පැහැදිලි අරමුණක් නොමැති, පාපයෙන් පිරි, කාගේ හෝ නමට හෝ ස්වරූපයට ගොදුරු වී ඇති අයට මෙම කාර්යය කළ නොහැකියි. මේ සඳහා ඉතා පැහැදිලි මනසක් තිබිය යුතුයි. ප්‍රතිඵලය ලැබෙන්නේ අවසානයේදීයි. දැන් සෑම කෙනෙක්ම අනුපිළිවෙලක් ඇතිවයි ඉන්නේ. මිනිස්සු කියනවා ව්‍යාස් දෙවියන් ආගමික ග්‍රන්ථ ලිව්වා කියා. ව්‍යාස්, දෙවියන් විය නොහැකියි. ඇත්තෙන්ම ආගමික ග්‍රන්ථ තිබෙන්නේ හතරයි. භාරතයේ එකම ආගමික ග්‍රන්ථය වන්නේ ගීතාවයි. එය සියලු ආගමික ග්‍රන්ථයන්ගේ මව හා පියායි. ඔබට උරුමයක් ලැබෙන්නේ එමගින් පමණයි. ඔබ මව මාර්ගයෙන් පියාගෙන් උරුමය හිමිකර ගන්නවා. ගීතා මවගේ පියා තමයි නිර්මාණකරුවා.

ඉතින් පියා ගීතාව මාර්ගයෙන් ඒ පෞරාණික වූ පහසු රාජයෝගා දැනුම ලබා දෙනවා. භාරත දේශයේ ආගමික ග්‍රන්ථය වන්නේ ගීතාවයි. ඒ වගේම මුස්ලිම් ආගමටත් තම ආගමික ග්‍රන්ථය තිබෙනවා. බෞද්ධයින්ටත් එසේමයි. ක්‍රිස්තු ධර්මයත් එසේමයි. සියල්ලගේම මව හා පියා ගීතාවයි. අනෙක් සියලු ආගමික ග්‍රන්ථ එහි දරුවන්. ඒවා පැමිණියේ පසුවයි. සියලු වේදාවන් හා උපනිෂද් අයත් වන්නේ කුමන ධර්මයටද? ඒවා කිව්වේ කවුද, ඒවා මඟින් බිහි වූ ධර්මය කුමක්ද යන්න ගැන ඔබ දැනගත යුතුයි. ආගමක් ඇත්තේ නැහැ. පළමුවෙන්ම, ගීතාව බොරුවක් කර තිබෙනා බව ඔප්පු කරන්න. පියාගේ නම වෙනුවට ඔවුන් දරුවාගේ නම යොදා තිබෙනවා. සෑම කෙනෙකුගේම ජීවිත කතාව වෙනස්. පියා කියනවා සියලු ශරීර සබඳතා ඉවත් කර දමා මා පමණක් සිහිපත් කරන්න. දෙවියන් කතා කරන්නේ ජීවයන්ටයි අශාරීරිකත්වයට පත්ව මා සිහිපත් කරන්න. මෙසේ කිව හැක්කේ අශාරීරික පියාට පමණයි. සන්යාසීන්ට මෙය කිව නොහැකියි. මේ ගීතාවේ වචනයි. ඔහු කතා කරන්නේ සෑම ආගමකම සිටිනා අයටයි ඔබ අශාරීරිකත්වයට පත්වේවා! නාටකය දැන් අවසන් වන්නට ආසන්නයි. සෑම කෙනෙක්ම මන්ත්‍රය ලබා ගන්නවා ඔබේ ශරීරයත් සියලු ශරීර සබඳතාත් ඉවත් කර දමා මා පමණක් සිහිපත් කරන්න. එවිට ඔබට මා වෙත පැමිණිය හැකියි. විමුක්තියෙන් පසු, අනිවාර්යෙන්ම ජීවන මුක්තිය හිමිවනු ඇත. ඔබ ලබනා තත්ත්වය වන්නේ විමුක්තිය මාර්ගයෙන් ජීවන මුක්තියයි. මෙහි එන ඕනෑම කෙනෙක් සතෝ, රජෝ හා තමෝ යන තත්ත්වයන් පසු කොට යනවා. මෙම විස්තරය ඉතාමත් හොඳයි. කොහොමනමුත්, දරුවන් එක් කණකින් අසා අනෙක් කණින් එය ඉවත් කරනවා. එසේ නැති නම්, මෙය ඉතාමත් පහසු දෙයක්. බොහෝ තැන්වල ඔබට ප්‍රදර්ශන පැවැත්විය හැකියි. ඉතින්, පත්තරවලත් මේ ගැන පල කරන්න. මේ සඳහා ඔබට මුදලක් වැය කළ හැකියි සෑම කෙනෙක්ටම ඒ ගැන අසන්නට ඉඩ සළස්වන්න. ඔබ අනිවාර්යෙන්ම පත්තරවල මෙය පල කළ යුතුයි. දරුවන් තුළ සෑහෙන කුල්මත්භාවයක් තිබිය යුතුයි. කොහොමනමුත්, තවත් ඉතිරි වී තිබෙන්නේ කෙටි කාලයක්. අතීන්ද්‍රිය සතුට ගැන ගොපළු ගොපලියන්ගෙන් විමසා බලන්න. මෙවන් දෙයක් සිහිපත් කෙරෙනවා මේ තමයි ගෝප් වල්ලභහි ගොපළු ගොපලියන්. ගොපළු ගොපලියන් ස්වර්ණමය යුගයේ ඇත්තේ නැහැ. කලි යුගයේ ඇත්තේත් නැහැ. එහි ලක්ෂ්මී හා රාධේ යන දේවතාවියන් ඉන්නවා. ගොපළු ගොපලියන් ඉන්නේ දැන් ගෝපි වල්ලභහි මුණුපුරු, මිණිපිරියන් වන්නේ ඔවුන්. ඉතින්, අනිවාර්යෙන්ම සීයාත් සිටිය යුතුයි. සීයා, බාබා හා මමා තමයි සංගම යුගයේ නව නිර්මාණය වන්නේ. පියා කියනවා මා නව ලෝකය නිර්මාණය කිරීම උදෙසා සෑම චක්‍රයකම සංගම යුගයේදී පැමිණෙනවා. යක්ෂ දරුවන්ව සිට ඔබ දේව දරුවන් බවට පත්ව සිටිනා අතර පසුව දිව්‍ය දරුවන් බවට ද පත්වනු ඇත. පසුව ඔබගේ උපත් 84 තුළ වෛශ්‍ය, ක්ෂත්‍රිය හා ශුද්‍ර තත්ත්වයන්ටත් පත්වනු ඇත. ඒ අතරම ව්‍යාප්තියත් සිදුවනවා. මෙම වෘක්ෂයත් සම්පූර්ණ විය යුතුයි. කිසිම විටෙක සමූල ඝාතනයක් සිදුවන්නේ නැහැ. අවිනාශී වූ දේශය වන්නේ භාරතයයි. භාරතය අනිවාර්යෙන්ම ප්‍රශංසාවට ලක්විය යුතුයි. සියලු දේශයන්ට වඩා ශ්‍රේෂ්ටතම වන දේශය භාරතයයි එය කිසිමදාක විනාශ නොවනු ඇත. අච්චා.

සුමිහිරි, ආදරණීය, බොහෝ කාලයක් තිස්සේ නැති වී සිට දැන් හමු වුණු ඔය දරුවන්ව ඔබගේ මව, පියා, බාප්දාදා සෙනෙහසින් සිහිපත් කර සුබ උදෑසනක් ප්‍රාර්ථනා කරයි. ආධ්‍යාත්මික පියාගෙන් ආධ්‍යාත්මික දරුවන්ට නමස්කාර.

### රාත්‍රි පංතිය 1968/04/16

එය සංගම යුගය වන විට, ඔය බ්‍රහ්මින් දරුවන් හැර වෙනින් කිසිවකු එය නොදනී. චක්‍රයේ සංගම යුගය ගැන බොහෝ වර්ණනා තිබේ. පියා පැමිණ ඔබට රාජ යෝගාව උගන්වයි. නිසැකයෙන්ම ස්වර්ණමය යුගයට පෙරාතුව සංගම යුගය පැමිණිය යුතුයි. මෙහි මනුෂ්‍යයින් සිටියි සමහරුන් පහත්ම අය වන අතර සමහරුන් උසස්ම අයයි. මිනිසුන්, ඔවුන් (දේවතාවන්) ඉදිරියේ ගුණ ගායනා කරති ඔබ, උසස්ම මනුෂ්‍ය ජීවයන් වන අතර පහත්ම අය අපියි. ඔවුන්ම කියනවා මම මේ ආකාරයේ කෙනෙක්. මෙම බොහෝ සේ ශුභ සංගම යුගය ගැන ඔය බ්‍රහමින් හැර වෙනින් කිසිවෙකු නොදනී. මිනිසුන් එය ගැන දැනගන්නා අන්දමට අපි එය ප්‍රචාරය කරන්නේ කොහොමද? දෙවියන්ම සංගම යුගයේදී පැමිණ අපට රාජ යෝගාව උගන්වයි. ඔබ රාජ යෝගාව ඉගෙනගන්නා බව ඔබ දන්නවා. මිනිසුන්ට එය දැනගැනීමට, අපි කුමන ක්‍රමවේදයක් නිර්මාණය කළ යුතුද? කෙසේවෙතත් මෙය ක්‍රම-ක්‍රමයෙන් සිදුවෙයි. දැන් තවමත් කාලය තිබේ. බොහෝ කල් ගත වී, තව කෙටි කලක් ඉතිරි වී තිබේ. මිනිසුන් වේගවත් උත්සාහයන් වල යෙදවීමට අප මෙසේ කියනවා. ඇත්ත වශයෙන්ම තත්පරයකදී දැනුම ලැබෙන අතර, එම වෙලාවේ, ඔබ තත්පරයකදී ජීවන-මුක්තිය ලබා ගන්නවා.

කෙසේවෙතත් චක්‍ර භාගයක පාපයන් ඔබගේ හිස මත තිබෙන අතර, ඒවා තත්පරයකදී කැපී යන්නේ නැත එයට කල් ගත වනවා. මිනිසුන් සිතනවා තව කල් තිබෙනවා, අප දැන්ම බ්‍රහ්ම කුමාරීන් වෙතට යන්නේ කුමකටද? ඔවුන් පොත් පිංච වලින් වැරදි අන්දමින් කරුණු වටහා ගන්නවා. එය ඔවුන්ගේ භාග්‍යයේ නොමැති නම්, ඔවුන් වැරදියට වටහා ගන්නවා. මෙය, උසස්ම මනුෂ්‍යයින් වීමට ඇති යුගය බව ඔබට වැටහෙනවා. දියමන්තියක් මෙන් වීමට ඇති ප්‍රශංසාව මෙයයි. ඉන්පසු එය අඩුවනවා ස්වර්ණමය යුගය, ඉන්පසුව රිදී යුගය. මෙම සංගම යුගය, දියමන්ති යුගයයි. සත් යුගය, ස්වර්ණමය යුගයයි. මෙම සංගම යුගය දිව්‍යලෝකයටත් වඩා හොඳ බව, ඔබ දන්නවා මෙම උපත දියමන්තියක් මෙනි. අමරණීය දේශයේ වර්ණනාව තිබේ. ඉන්පසුව එය අඛණ්ඩව අඩුවෙයි. ඉතිං ඔබට මෙසේ ලිවිය හැක වඩාත්ම ශුභ සංගම යුගය, දියමන්තියකි, සත් යුගය, රත්තරං‍ය, ත්‍රේත යුගය (රිදී යුගය) රිදීය. ඔබ මනුෂ්‍යයින්ගෙන් දේවතාවන් බවට පත් වන්නේ, සංගම යුගයේදී පමණක් බව ඔබට විස්තර කළ හැක. ඔවුන් මැණික් අටකින් යුත් මාලාවක් සාදා, එහි මැද දියමන්තියක් තබයි. සංගම යුගයේ දීප්තිය තිබේ. සංගම යුගය දියමන්තියක් මෙනි. සංගම යුගයේදී දියමන්තියක වටිනාකමක් තිබේ. ඔබට යෝගාව ආදිය උගන්වන අතර මෙයට ආධ්‍යාත්මික යෝගාව යැයි කියයි. කෙසේවෙතත් ආධ්‍යාත්මික වන්නේ පියා පමණයි. ඔබට සංගම යුගයේදී පමණයි ආධ්‍යාත්මික පියාව මුණ ගැසී, ආධ්‍යාත්මික දැනුම ලැබෙන්නේ. බොහෝ අහංකාරය ඇති මනුෂ්‍යයින් මෙය එතරම් විගසින් පිළිගන්නේ කොහොමද? මෙය විස්තර කරනු ලබන්නේ දුප්පත් මිනිසුන්ටයි. ඉතිං ඔබ මෙසේද ලිවිය යුතුයි සංගම යුගය, දියමන්ති යුගය වන අතර, එහි කාලවකවානුව මෙපමණයි. සත් යුගය, ස්වර්ණමය යුගය වන අතර, එහි කාල වකවානුව මෙපමණයි. ඔවුන් ආගමික ග්‍රන්ථ වල ස්වස්තිකය පෙන්වා තිබේ. ඉතිං ඔය දරුවන්ට මෙය සිහි වන විට ඔබට බොහෝසේ සතුට ඇති වෙයි. ශිෂ්‍යයින්ට සතුට තිබෙනවා, එසේ නොවේද? හොඳම දිවිය, ශිෂ්‍ය දිවියයි. මෙය ඔබගේ ආදායම් මාර්ගයයි. මනුෂ්‍යයින්ගෙන් දේවතාවන් බවට පරිවර්ථනය වන පාසැල මෙයයි. දේවතාවන්, ලෝකයේ පාලකයන් වීය. ඔබ මෙය දැන් දන්නවා. එබැවින් අසීමිත සතුට තිබිය යුතුයි. මේ නිසයි මෙම ප්‍රශංසාව ඇත්තේ ඔබට අතීන්ද්‍රීය සුඛය ගැන දැන ගැනීමට අවශ්‍ය නම්, ගෝපිවල්ලභයාගේ ගෝප් සහ ගෝපීන්ගෙන් ඒ ගැන අසන්න. ගුරුවරයා ඔබට අවසානය තෙක්ම උගන්වන බැවින් අවසානය දක්වාම ඔබ ඔහු සිහි කළ යුතුයි. දෙවියන් ඔබට උගන්වනවා, පසුව දෙවියන් ඔබව, ඔහුත් සමඟ ආපසු රැගෙන යයි. මිනිසුන් හඬ ගසන්නේ විමුක්තිය ලබා දෙන්නාණනි, මාර්ගෝපදේශකයාණනි, අපව දුකින් මුදවාගන්න! ස්වර්ණමය යුගයේ දුකක් නොමැත. ඔවුන් කියන්නේ ලෝකයේ සාමය තිබිය යුතුයි. ඔවුන්ගෙන් අසන්න මීට පෙර සාමය තිබුණේ කවදාද? එම යුගය කුමක්ද? කිසි කෙනෙක් ඒ ගැන දන්නේ නැත. රාමාගේ රාජ්‍යය, ස්වර්ණමය යුගය වන අතර, රාවන ගේ රාජධානිය කලි යුගයයි. ඔබ මෙය දන්නවා, එහෙම නේද? දරුවන් ඔවුන්ගේ අත්දැකීම් කිව යුතුයි. හදවතේ ඇති කුමන දේවල්ද මා බෙදා ගන්නේ? අසීමිත ආධිපත්‍යය ලබා දෙන අසීමිත පියාව මා සොයා ගෙන තිබේ, ඉතිං මා වෙන කුමන අත්දැකීමක් බෙදා ගන්නද? වෙනින් කිසිවක් නොමැත! මෙවන් සතුටක් නොමැත. කිසි කෙනෙක් තව කෙනෙක් සමඟ උරණ වී, නිකම් ගෙදරට වී නොසිටිය යුතුයි. එය, ඔබගේ භාග්‍යය සමඟ උරණ වනවා මෙනි. ඔබ තම ඉගෙනුම සමඟ උරණ වන්නේ නම්, ඔබ කුමක් ඉගෙන ගනීද? පියා ඔබට ඉගැන්විය යුත්තේ බ්‍රහ්මාගේ මාර්ගයෙනි. එබැවින්, ඔබ එකිනෙකා සමඟ උරණ නොවිය යුතුයි. එය මායායි. රාක්ෂකයින් විසින් යාගහෝමයට බාධා පමුණුවයි. අච්චා.

ආධ්‍යාත්මික බාප් සහ දාදාගෙන් සුමිහිරිම ආධ්‍යාත්මික දරුවන්ට, සෙනෙහස, සිහිපත් කිරීම සහ ශුභ රාත්‍රියක්. ආධ්‍යාත්මික පියා, ආධ්‍යාත්මික දරුවන්ට නමස්තේ කියයි.

**ධාරණය සඳහා සාරාංශය:**

1. පියා ඔබට කියන කුමන හෝ දේකට, එක කනකින් සවන්දී, අනෙක් කනින් එය පිටතට නොදමන්න. දැනුමේ කුල්මත්භාවය තබාගෙන, අතීන්ද්‍රීය සුඛය අත්විඳින්න.
2. තත්පරයකදී ඔවුන්ට මුක්තිය සහ ජීවන මුක්තියට අයිතියක් ලබා දීම පිණිස, සෑම කෙනෙකුටම මෙම මහා මන්ත්‍රය පවසන්න 'ඔබගේ ශරීරය සහ සියලුම ශාරීරික නෑදැයින් අතහැර දමා එක් පියා පමණක් සිහිපත් කරන්න.'

**වරදානය:** ඔබ, බ්‍රහ්ම පියාව අනුගමනය කිරීමෙන්, සමාන වී, ප්‍රථම ශ්‍රේණිය හිමිකර ගනිත්වා.
බ්‍රහ්ම පියා කෙරෙහි සියලු දරුවන් තුළ බොහෝ සෙනෙහස තිබෙන අතර, සෙනෙහසේ සලකුණ වන්නේ, සමාන වීමයි. මේ සඳහා, සෑම විටෙකම ප්‍රථමයා වීමේ අරමුණ තබාගන්න.

ඊර්ෂ්‍යාව නිසා ප්‍රථමයා නොවන්න, මන්ද එය හානිකරයි. කෙසේ නමුත් ඔබ එය පවසා, ඉන්පසුව ප්‍රායෝගිකව, පියාව අනුගමනය කිරීමේදී ප්‍රථමයා වන්නේ නම්, එවිට ප්‍රථමයා සමඟ සිටීමෙන්, ඔබත් ප්‍රථමයා වෙයි. බ්‍රහ්ම පියා ප්‍රථමයා වූ ආකාරයෙන්, ඔහුව අනුගමනය කරන සියලු දෙනාද ප්‍රථම අංකය වීමේ අරමුණ තබා ගන්න. මුලපුරන අය අංක එක, අර්ජුන වන අතර, ප්‍රථම අංකයට පැමිණීමට සියලු දෙනාට එම අවස්ථාව තිබේ. ප්‍රථම ශ්‍රේණිය අසීමිතයි, එය ටික දෙනෙකුගේ පමණක් නොවෙයි.

**පාඨය:** සාර්ථකත්වයේ ප්‍රතිමූර්තියක් වීමට, තමන්ට සහ අන් අයට එකවර සේවය කරන්න.

***** ඕම් ශාන්ති *****